රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.

**இணைந்த சேவைகள் பிரிவு**
சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை.

COMBINED SERVICES DIVISION
*Independence Square, Colombo 07, Sri Lanka*

| | | | |
|---|---|---|---|
| දුරකථනය<br>தொலைபேசி: **(94) 011- 2694560**<br>Telephone | ෆැක්ස්<br>தொலைநகல்: **(94) 011- 2692254**<br>Fax | ඊ-මේල්<br>மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk**<br>E-mail | වෙබ් අඩවිය<br>இணைத்தளம்: **www.pubad.gov.lk**<br>Web Site |

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | CS/ICTS/01/EB Ex. (II) | ඔබේ අංකය<br>உமது இல<br>Your No | |
| දිනය<br>திகதி:<br>Date | 2024.03.21 | | |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ කොමිෂන් සභා ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ දිස්ත්‍රික් ලේකම්වරු/ප්‍රාදේශීය ලේකම්වරු,

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීම**

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවල ප්‍රතිඵල මෙම අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර ඊට අමතරව එක් එක් නිලධාරීන් වෙත වෙන වෙනම දන්වා යැවීම සිදු කරනු ලබයි.

02. වෙන් වෙන් වශයෙන් නිලධාරීන් වෙත කාර්යක්ෂමතා කඩඉම් ප්‍රතිඵල නිකුත් කිරීම කාලය ගත වන අත්‍යාවශ්‍ය නොවන සහ අතිරේක පිරිවැයක් දැරීමට සිදු වන කටයුත්තක් බව පෙනී ගොස් ඇත. ආයතන ප්‍රධානීන් ද නිලධාරීන්ගේ ආයතනික කටයුතු සිදු කිරීමේ දී එක් එක් නිලධාරීන් වෙත වෙන් වෙන්ව නිකුත් කරනු ලබන ප්‍රතිඵල මත කටයුතු කිරීමට හුරු වී ඇති බැවින් යම් හෙයකින් ප්‍රතිඵලය ඇතුළත් ලිපිය අස්ථානගත වීමක් සිදු වුවහොත් නැවත ඒ සම්බන්ධව කටයුතු කිරීමේ දී අනවශ්‍ය ප්‍රමාදයන් ඇතිවන බව ද නිරීක්ෂණය වී ඇත. ඒ අනුව ඉදිරියේ දී පහත පරිදි කටයුතු කරන මෙන් කාරුණිකව දන්වන අතර මින් ඉදිරියට අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු සහ කාර්යාල මට්ටමින් වෙන් වෙන් වශයෙන් කාර්යක්ෂමතා කඩඉම් ප්‍රතිඵල නිකුත් නොකරන බව ද කාරුණිකව දන්වමි.

I. දැනටමත් සිදු කරන පරිදි ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ගැසට් කරනු ලැබ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන්ගේ සියලුම පන්ති සහ ශ්‍රේණි සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කිරීමට කටයුතු කරනු ලැබේ.

II. එම ප්‍රතිඵල ලේඛනයට අනුව අදළ විභාගයට පෙනී සිටි, ඔබ ආයතනයේ සේවයේ නියුතු ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන් වෙත ඔබගේ අත්සනින් යුතුව ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කරන්න. නිලධාරියාගේ ස්ථිර කිරීම, උසස් කිරීම ආදී ආයතනික කටයුතු සඳහා යොමු කිරීමේ දී අදළ ලේඛන සමග එම ලිපියේ සහතික කළ පිටපතක් මා වෙත යොමු කිරීම ප්‍රමාණවත් වේ.

III. අමාත්‍යාංශ වෙබ් අඩවියෙන් ලබාගත් නිලධාරියාගේ නම ඇතුළත් ප්‍රතිඵල ලේඛනයේ ඔබ විසින් සහතික කළ ඡායා පිටපතක් ද නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුවට අනිවාර්යයෙන්ම ඇතුළත් කළ යුතු ය.

IV. දැනටමත් සිදු කෙරෙන පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල මෙම අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ පළ කිරීමට කටයුතු කරන බැවින් ඒ සම්බන්ධව අදළ නිලධාරීන් පෞද්ගලිකව අවධානය යොමු කළ යුතු බව එම නිලධාරීන් දැනුම්වත් කරන්න.

03. මේ වන විට මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කර ඇති 2023.06.04, 10 සහ 11 දිනවල පැවැත්වූ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තිය I ශ්‍රේණියේ, 3 පන්තිය II ශ්‍රේණියේ සහ 3 පන්තිය III ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් ද ඉහත උපදෙස් පරිදි කටයුතු කරන්නේ නම් මැනවි.

04. ඔබගේ පහසුව සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්/අසමත් බව තීරණය වන ආකාරය මේ සමග ඇති ඇමුණුම මගින් දක්වා ඇත.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

ඇමුණුම 01

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තිය I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

අංක 1894/26 හා 2014.12.26 දිනැති සේවා ව්‍යවස්ථාවේ 15 වැනි උපලේඛනය

| ප්‍රශ්න පත්‍රය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතිය | | |
| I. ව්‍යාපෘති වාර්තාව | 60 | 30 |
| II ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කිරීම | 40 | 20 |

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තිය II ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

අංක 1894/26 හා 2014.12.26 දිනැති සේවා ව්‍යවස්ථාවේ 14 වැනි උපලේඛනය

| ප්‍රශ්න පත්‍රය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. කාර්යාල කළමනාකරණය | 100 | 40 |
| 2. ඉ - රාජ්‍ය සංකල්පය හා තොරතුරු තාක්ෂණ කළමනාකරණය | | |
| I වැනි ප්‍රශ්න පත්‍රය - බහුවරණ | 40 | 16 |
| II වැනි ප්‍රශ්න පත්‍රය - රචනාමය | 60 | 24 |

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තිය III ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

අංක 1894/26 හා 2014.12.26 දිනැති සේවා ව්‍යවස්ථාවේ 13 වැනි උපලේඛනය

| ප්‍රශ්න පත්‍රය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. ආයතන සංග්‍රහය හා පරිපාලනය | 100 | 40 |
| 2. මුදල් රෙගුලාසි හා රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | 100 | 40 |
| 3. කළමනාකරණය හා සංවිධානය | 100 | 40 |

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තිය I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

අංක 1894/26 හා 2014.12.26 දිනැති සේවා ව්‍යවස්ථාවේ 12 වැනි උපලේඛනය

| ප්‍රශ්න පත්‍රය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හා ඉ - රාජ්‍ය | 100 | 40 |

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තිය II ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

අංක 1894/26 හා 2014.12.26 දිනැති සේවා ව්‍යවස්ථාවේ 11 වැනි උපලේඛනය

| ප්‍රශ්න පත්‍රය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. ආයතන සංග්‍රහය | 100 | 40 |
| 2. මුදල් රෙගුලාසි | 100 | 40 |

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තිය I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

අංක 1894/26 හා 2014.12.26 දිනැති සේවා ව්‍යවස්ථාවේ 10 වැනි උපලේඛනය

| ප්‍රශ්න පත්‍රය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - ලිඛිත පරීක්ෂණය | 50 | 20 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය- ප්‍රායෝගික පරීක්ෂණය | 50 | 20 |

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තිය II ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

අංක 1894/26 හා 2014.12.26 දිනැති සේවා ව්‍යවස්ථාවේ 09 වැනි උපලේඛනය

| ප්‍රශ්න පත්‍රය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 100 | 40 |

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තිය III ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

අංක 1894/26 හා 2014.12.26 දිනැති සේවා ව්‍යවස්ථාවේ 08 වැනි උපලේඛනය

| ප්‍රශ්න පත්‍රය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. ආයතන සංග්‍රහය | 100 | 40 |
| 2. මුදල් රෙගුලාසි | 100 | 40 |